(√ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

7.1 "ඔව්" නම් විස්තර සඳහන් කරන්න : ..........................................................................................................................
..........................................................................................................................................................................

8.0 අයදුම්කරුගේ සහතිකය :

(*අ*) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(*ආ*) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙක් වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(*ඇ*) තව ද යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

(*ඈ*) මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

..........................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ............................................

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය .................................. දින මා ඉදිරිපිට දී ඉහත 8.0 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

.........................................................,
සහතික කරන්නාගේ අත්සන.

දිනය : .............................................
සහතික කරන්නාගේ නම : .........................................
තනතුර : ...............................................................
ලිපිනය : ...............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12 - 44

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### සූපවේදී තනතුර

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග **2025 දෙසැම්බර් 26** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. තමන් අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකිය)

**සූපවේදී තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව 04)**

1. *වැටුප් පරිමාණය -*

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු. 51,020 – 11x590 / 10x680 – රු. 64,310 වේ.

(සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.89,000/- පමණ වේ).

2. *වයස් සීමාව -*

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 40ට නොවැඩි විය යුතු ය.

3. *අධ්‍යාපන සුදුසුකම් -*

සිංහල / දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම.

4. *වෘත්තීය සුදුසුකම් -*

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) / වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) හෝ රජය විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයක මූලික සූපවේදී පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

5. *පළපුරුද්ද -*

ඉහත (3) සහ (4) හි සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, තරු පංතියේ හෝටලයක/ රජය විසින් පිළිගත් ආයතනයක සූපවේදී තනතුරක වසර 05කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

6. *බඳවා ගැනීමේ ක්‍රමය -*

ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි. (මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50% ක් බාහිර අයදුම්කරුවන්ගෙන් සහ ඉතිරි 50% අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ)

7. *පරීක්ෂණ පටිපාටිය -*

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයක් මගින් සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අයදුම්කරුවන්ගේ

සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

**(අ) ප්‍රායෝගික පරීක්ෂණය -**
බඳවා ගැනීමේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, ඉන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

**(ආ) සම්මුඛ පරීක්ෂණය -**
සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබාදෙනු ලැබේ. එහි දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| *අනු. අංකය* | *විෂය ක්ෂේත්‍රය* |
|---|---|
| 1 | අමතර අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂයය දැනුම |
| 3 | වෘත්තීය පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය සහ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**8.** ***සේවා නියමයන් හා කොන්දේසි -***

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මකවන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට බලය ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට අදාළවන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(vi) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ඇත.

**9.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය:-

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

**10.** රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

**11.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**12.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**13.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ, ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ, දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන (දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ, ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කුෂානි රෝහණදීර,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
2025 නොවැම්බර් මස 27 දින.

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ආදර්ශ අයදුම්පත්‍රය

### සූපවේදී තනතුර

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) :-
..........................................................................................................................
..........................................................................................................................

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්): -
..........................................................................................................................
..........................................................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):- (Mr./Mrs. /Miss.)
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. (අ) පෞද්ගලික ලිපිනය:-
..........................................................................................................................
..........................................................................................................................

දුරකථන අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ආ) කාර්යාලයීය ලිපිනය:-
..........................................................................................................................
..........................................................................................................................

දුරකථන අංකය:-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ඇ) කැඳවීම් ලිපිය තැපැල් කළ යුතු ලිපිනය :-

පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (අ) උපන් දිනය :- ...................................................
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය.)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු ....... මාස ....... .දින.......

05. විවාහක අවිවාහක / බව : - (විවාහක / අවිවාහක)

06. ස්ත්‍රී / පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07 . ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව:- (ඔව් / නැත)

08. අධ්‍යාපන සුදුසුකම්:- (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

අ.පො.ස. (උ/පෙළ) විභාගය :-

| *විෂයය* | *සාමර්ථ්‍යය* | *වර්ෂය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

අ.පො.ස. (සා/පෙළ) විභාගය :-

| *විෂයය* | *සාමර්ථ්‍යය* | *වර්ෂය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. *වෘත්තීය සුදුසුකම්* :- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

| *පාඨමාලාව* | *ආයතනය* | *කාල පරිච්ඡේදය* | *ක්‍රියාත්මක වන දිනය* ***(effective date)*** |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. *පළපුරුද්ද* :- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

| *ආයතනය* | *තනතුර* | *සේවා කාලය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

11. *වෙනත් සුදුසුකම්*:- (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

12 . වත්මන් රැකියාව පිළිබඳ විස්තර :- (අදාළ ලේඛනවල පිටපත් ඇමිණිය යුතු ය)

(අ) ආයතනයේ නම හා ලිපිනය:-.......................................................................

(ආ) මුල් පත්වීමේ දිනය:-.............................................................................

(ඇ) දැනට දරන තනතුර:-...............................................................................

(ඈ) මාසික මූලික වැටුප :-...........................................................................

(ඉ) දීමනා :-.................................................................................................

(ඊ) දළ වැටුප:-..............................................................................................

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න :- ..............................................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද ? (ඔව්/නැත)
එසේ නම්, එම විස්තර සඳහන් කරන්න:-
..................................................................................................................................

ම විසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

දිනය :.............................. ...............................................,
අයදුම්කරුගේ අත්සන

-----------------------------------------------------------------------------------------------------------------------------------

<u>දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>

**(රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ............................... තනතුර දරන, ................................ මයා / මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති / නොමැති බවත්, ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක / නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය : .............................. .....................................................,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

12 - 117

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පරිසර අමාත්‍යාංශය**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික/ තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 නිලධර ගණයට අයත් වනසත්ත්ව නියාමක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2024 (2025)**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, III ශ්‍රේණියේ වනසත්ත්ව නියාමක තනතුරු පුරප්පාඩු 257 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවාගනු ලබන සංඛ්‍යාවෙන් 3% ක් කාන්තා අයදුම්කාරියන් සඳහා වෙන් කරනු ලැබේ. ප්‍රමාණවත් අයදුම්කාරියන් සංඛ්‍යාවක් සුදුසුකම් නොලදහොත් ඉතිරි සංඛ්‍යාව ද පිරිමි අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ. මෙම විභාගය **2026 මාර්තු මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තෝරාපත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරිවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

**01.** වැටුප් ක්‍රමය :

මාස 06 ක පුහුණු කාලය තුළ පුහුණුවන වනසත්ත්ව නියාමක තනතුර සඳහා රු:18,500/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ වනසත්ත්ව නියාමක III තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 45,230 – 10x540 – 11x630 – 10x890 – 10x1190 - රු. 78,360 (MN 1 – 2025) වේ.

එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**02.** **සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමනයන් හා සේවා කොන්දේසි:**

i. වනසත්ත්ව නියාමක තනතුර සඳහා තෝරාගනු ලබන සියලුම දෙනා පුහුණු වනසත්ත්ව නියාමක ලෙස මාස 06 ක කාලයක් සඳහා බඳවා ගනු ලබන අතර එම කාලය සඳහා දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුව සාර්ථකව අවසන් කරන නිලධාරීන් වනසත්ත්ව නියාමක III ශ්‍රේණියේ තනතුරට පත්කරනු ලැබේ.

ii. පුහුණුව සාර්ථකව අවසන් කිරීමට අසමත්වන හෝ පුහුණු කාලය තුළ දී පුහුණුව අතහැර යන තැනැත්තකුට නැවත මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීම සඳහා හිමිකමක් නොමැත.

iii. වනසත්ත්ව නියාමක III ශ්‍රේණියට පත්වීමට සුදුසුකම් ලබන නිලධාරීන්ගේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ. තව ද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු වේ. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

iv. පත්වීම අවු. 03 ක පරිවාස කාලයකට යටත් වේ.

v. වනසත්ත්ව නියාමකයන්ගේ සේවා ස්ථාන දිවයිනේ වනගත ප්‍රදේශවල පිහිටි දුෂ්කර සේවා ස්ථාන වන අතර, තෝරා ගනු ලබන අපේක්ෂකයින් නියෝග කරනු ලබන පරිදි දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් ව සිටිය යුතු ය.

vi. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

03. **වයස් සීමාව:**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.01.05 දිනට වයස අවු.18 ට නොඅඩු සහ අවු. 30 ට නොවැඩි විය යුතු ය. ඒ අනුව 2008.01.05 දිනට හෝ ඊට පෙර හා 1996.01.05 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අය පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

**04.** **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරක දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් හයක් (06) සමත් ව තිබීම;

*සහ*

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

III. *වෘත්තිය සුදුසුකම් :*

ක්ෂේත්‍රයේ ලබා ඇති සුදුසුකම් විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

IV. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.

V. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

VI. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

VII. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

VIII. පිරිමි අයදුම්කරුවන් උස අඩි 05 යි. අඟල් 04 කට නොඅඩු විය යුතු ය.

කාන්තා අයදුම්කරුවන් උස අඩි 05 යි. අඟල් 02 කට නොඅඩු විය යුතු ය.

**05. බඳවා ගැනීමේ ක්‍රමය:**

I. ඉහත 04 ඡේදය යටතේ සුදුසුකම් ලබන, ලිඛිත පරීක්ෂණයකින් සමත් අයදුම්කරුවන් ලබාගන්නා සමත් ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ මත බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක්කර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබාගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ මත, නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී ලෙස බඳවා ගනු ලැබේ.

II. බඳවා ගැනීමට පවත්නා අවසන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමේ දී, සමාන ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනකු සිටියහොත්, එයට ඉහළ ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීම හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

III. ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාව අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපීව සකසන ලද ප්‍රතිඵල ලේඛනය වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබා දෙනු ඇත. අනතුරුව විභාගයට අයදුම්කරන ලද සියලු දෙනා හට පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk යන වෙබ් අඩවිය ඔස්සේ හෝ සිදුකරනු ඇත.

IV. පුහුණු කාල සීමාව සාර්ථක ලෙස අවසන් කරන අයදුම්කරුවන් වනසත්ත්ව නියාමක III ශ්‍රේණියට වසර 03 ක පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, I කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමෙන් පසුව සහ වසර 03 ක සතුටුදායක සේවා කාලයකින් පසුව සේවයේ ස්ථිර කරනු ලැබේ.

**06. විෂයය නිර්දේශය:**

**I. ලිඛිත විභාගය**

| *විෂයයන්* | *උපරිම ලකුණු* | *කාලය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | 100 | පැය 1 | 40% |

අපේක්ෂකයන්ගේ සිතීම, තර්ක හැකියාව, විශ්ලේෂණ හැකියාව හා තීරණ ගැනීමේ හැකියාව හඳුනා ගැනීමට හැකිවන පරිදි සකස් කෙරෙන කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුත් ප්‍රශ්න පත්‍රයකි.

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

II. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ :

| *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අමතර අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 2. වෘත්තීය සුදුසුකම් | 40 |
| 3. බාලදක්ෂ, පරිසර නියමුහට, ශිෂ්‍යභට කණ්ඩායම් නියෝජනය කිරීම | 15 |
| 4. ක්‍රීඩා කුසලතා | 20 |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන දක්ෂතා | 05 |
| එකතුව | 100 |

**07. අයදුම්පත් හා අනෙකුත් විස්තර:**

I. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති **" Online Applications – Recruitment Exams/E.B. Exams"** ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 දෙසැම්බර් මස 08 වැනි දින පෙ.ව.09.00ට විවෘතවන අතර 2026 ජනවාරි මස 05 වැනි දින ප.ව. 09.00ට අවසන්වේ.**

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානින් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන

අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවක අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු / විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

III. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**08.** **විභාග ගාස්තු:**

විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

ii. අන්තර්ජාල ගෙවීම පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)

iii. ලංකා බැංකුවේ ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon)

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන:-*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

09. පහත සඳහන් ලිපි ලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය
II. අධ්‍යාපන සහතික
III. මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකයක් (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව)
IV. චරිත සහතික දෙකක්
V. වෙනත් අදාළ සහතික

*සැලකිය යුතුයි -* මෙම ලේඛන/ සහතික හෝ ඒවායේ පිටපත් අයදුම්පත සමග එවීම නොකළ යුතුයි.

10.

I. විභාගය මෙහි උප ලේඛනය - I හි දැක්වෙන නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වේ. අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර හා ඊට අදාළ අංක අයදුම්පතේ පළමු හා දෙවනි තේරීම වශයෙන් සඳහන් කළ යුතු ය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ

පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැතිනම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ඇත.

II. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයවන **2026 ජනවාරි 05 දිනට** හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්පතේ පිටපතක්, ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

III. අපේක්ෂයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු අතර, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම, තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

IV. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

11. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගත යුතු ය. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -**

තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අයදුම්කරුවකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම අවලංගු කළ හැකිය.

13. අවශ්‍ය අවස්ථාවක දී මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**උපලේඛනය - 1**

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක :

| *නගරය* | *නගර අංක* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |

| *නගරය* | *නගර අංක* |
|---|---|
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

අධ්‍යක්ෂ ජනරාල්,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,

අංක 811/ඒ, ජයන්තිපුර පාර,
බත්තරමුල්ල,
2025 ඔක්තෝබර් මස දින.

12 - 53/1

---

**පරිසර අමාත්‍යාංශය**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික/ තාක්ෂණික නොවන නිලධර ගණයේ III ශ්‍රේණියේ වනසත්ව අඩවි ආරක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2024 (2025)**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ වනසත්ව අඩවි ආරක්ෂක තනතුරු පුරප්පාඩු 114 ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **(පිරිමි අයදුම්කරුවන් පමණි.) අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේනතුවේ** www.doenets.lk **වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති " Online Applications – Recruitment Exams/E.B. Exams"** ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 දෙසැම්බර් මස 08 වැනි දින පෙ.ව.09.00 ට විවෘත වන අතර 2026 ජනවාරි මස 05 වැනි දින ප.ව. 09.00ට අවසන්වේ.** එසේම මෙම විභාගය **2026 මාර්තු මාසයේ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තෝරාපත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානින් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

**01. වැටුප් ක්‍රමය :**

මාස 06 ක පුහුණු කාලය තුළ පුහුණුවන වනසත්ව අඩවි ආරක්ෂක තනතුර සඳහා රු. 22,500/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 3 –2025 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ වැටුප් පරිමාණය - රු. 52,250 – 10x800 – 11x1,190 – 10x1,320 – 10x1,350 - රු. 100,040/- ක් වනඅතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ.

පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**02. සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි:**

i. වනසත්ව අඩවි ආරක්ෂක තනතුර සඳහා තෝරාගනු ලබන සියලුම දෙනා පුහුණු වනසත්ව අඩවි ආරක්ෂක ලෙස මාස 06 ක පුහුණු කාලයකට යටත් වේ.

ii. පුහුණු පාඨමාලාව අවසන් කරන නිලධාරින් වනසත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

iii. පුහුණුව සාර්ථකව අවසන් කිරීමට අසමත් වන හෝ පුහුණු කාලය තුළදී පුහුණුව අතහැර යන තැනැත්තකුට නැවත මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීම සඳහා කිසිදු හිමිකමක් නොමැත. ඒ සම්බන්ධව සිදුකරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.

iv. වනසත්ත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියට පත්වීමට සුදුසුකම් ලබන නිලධාරින්ගේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් වේ. තව ද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු වේ. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

v. පත්වීම අවු. 03 ක පරිවාස කාලයකට යටත් වේ.

vi. වනසත්ත්ව අඩවි ආරක්ෂකයන්ගේ සේවා ස්ථාන දිවයිනේ වනගත ප්‍රදේශවල පිහිටි දුෂ්කර සේවා ස්ථාන වන අතර, තෝරා ගනු ලබන අපේක්ෂකයන් නියෝග කරනු ලබන පරිදි දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

vii. *ගැසට්* පත්‍රයේ 2 ඡේදයෙහි පළකර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීමේ දී අදාළවන පොදු කොන්දේසි අදාළ වේ.

viii. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

03. **වයස් සීමාව:**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.01.05 දිනට වයස අවු.18 ට නොඅඩු සහ අවු. 30 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ නියතු අයට මෙම වයස් සීමාව අදාළ නොවේ.) ඒ අනුව 2008.01.05 දිනට හෝ ඊට පෙර හා 1996.01.05 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අය පමණක් මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

**04. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබිය යුතු ය;

*සහ*

II. පැරණි විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් උද්භිද විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථය සහිතව එක් වරක දී විෂයන් 04 කින් සමත්ව තිබීම;

*හෝ*

නව විෂය නිර්දේශය යටතේ අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 03 කින් එක් වරකදී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

III. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.

IV. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

V. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට තනතුර බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

VI. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

VII. පිරිමි අයදුම්කරුවන් පමණක් විය යුතු අතර, උස අඩි 05 යි. අඟල් 04 කට නොඅඩු විය යුතු ය. පපුව අඟල් 32 ක් විය යුතු ය.

**05. බඳවා ගැනීමේ ක්‍රමය:**

I. ඉහත 04 ඡේදය යටතේ සුදුසුකම් ලබන, ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් ලබාගන්නා සමස්ත ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ මත බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක්කර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හා ලිඛිත පරීක්ෂණයේ දී ලබාගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ මත, නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී ලෙස බඳවා ගනු ලැබේ.

II. බඳවා ගැනීමට පවත්නා අවසන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමේදී, සමාන ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනකු සිටියහොත්, එයට ඉහළ ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීම මඟින් අවසන් පුරප්පාඩුව නොපිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

III. ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලබාගත් ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාව අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපිතව සකසන ලද ප්‍රතිඵල ලේඛනය වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබා දෙනු ඇත. අනතුරුව විභාගයට අයදුම්කරන ලද සියලු දෙනා හට පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk යන වෙබ් අඩවිය ඔස්සේ හෝ සිදුකරනු ඇත.

IV. පුහුණු කාල සීමාව සාර්ථක ලෙස අවසන් කරන අයදුම්කරුවන් වනසත්ත්ව අඩවි ආරක්ෂක III ශ්‍රේණියට පත්වීමෙන් පසු වසර 03 ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමෙන් පසුව සහ වසර 03 ක සතුටුදායක සේවා කාලයකින් පසුව සේවයේ ස්ථිර කරනු ලැබේ.

**06. විෂය නිර්දේශය:**

**I. ලිඛිත විභාගය :**

| විෂයන් | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය හා අවබෝධය | පැය 1 | 100 | 40% |
| 02. සාමාන්‍ය දැනුම හා වනජීවී සංරක්ෂණය | පැය 2 | 100 | 40% |

**බුද්ධි පරීක්ෂණය හා අවබෝධය :**

පද, සංඛ්‍යා, රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු විශේෂයකි. අපේක්ෂකයින් දක්වන අනුමාන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලුව පිළිබඳ අවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය සහ අවකාශය අතර සම්බන්ධතාව වටහා ගැනීමෙහිලා අපේක්ෂකයන්ගේ හැකියාව මනින කෙටි ප්‍රශ්නවලින් යුතු ප්‍රශ්න පත්‍රයකි.

**සාමාන්‍ය දැනුම හා වනජීවී සංරක්ෂණය :**

වනජීවී සංරක්ෂණය පිළිබඳ ජාතික කලාපීය හා සමස්ත ලෝකයේ සංවිධාන, පරිසරය පිළිබඳ දැනුම හා සමාජීය, සංස්කෘතික හා විද්‍යාත්මක, දේශපාලනික, ආර්ථික කරුණු සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ දැනුවත්භාවය මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 2. භාෂා දැනුම | 10 |
| 3. පළපුරුද්ද | 20 |
| 4. වෘත්තීය සුදුසුකම් | 30 |
| 5. කුසලතා හා විශිෂ්ට දක්ෂතා | 15 |
| 6. පෞරුෂත්වය | 05 |
| **එකතුව** | **100** |

**07. අයදුම්පත් හා අනෙකුත් විස්තර:**

I. මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් යොමු කිරීම ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

II. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. රාජ්‍ය සේවයේ නියතු අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු / කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

**08. විභාග ගාස්තු:**

විභාග ගාස්තුව රු 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)
iii. ලංකා බැංකුවේ ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

*සටහන:-*

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

09. පහත සඳහන් ලිපි ලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය,
II. අධ්‍යාපන සහතික,
III. මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකයක් (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව),
IV. චරිත සහතික දෙකක්,
V. වෙනත් අදාළ සහතික.

10.

I. විභාගය මෙහි උප ලේඛනය 01 හි දැක්වෙන නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වේ. අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර හා ඊට අදාළ අංක අයදුම්පතේ ශීර්ෂයේ පළමු හා දෙවෙනි තේරීම වශයෙන් සඳහන් කළ යුතු ය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ඇත.

II. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2026.01.05 හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු යි. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. ඉහත සඳහන් විස්තර අදාළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව සංශෝධන සිදුකර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

III. අපේක්ෂයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු අතර, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම, තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

IV. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

11. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ

යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බල පත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -

තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම හෝ අවලංගු කළ හැකි ය.

13. අවශ්‍ය අවස්ථාවකදී මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**උපලේඛනය - 1**

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක :

| *නගරය* | *නගර අංක* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිළිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

අධ්‍යක්ෂ ජනරාල්,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

අංක 811/ඒ, ජයන්තිපුර පාර,
බත්තරමුල්ල.

12 - 53/2

---

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (I)**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගතවීමට පෙර සමත් විය යුතු තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2026 පෙබරවාරි මස මහනුවර දී** පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාගය පිළිබඳ විස්තරය - 2013.12.13 දිනැති අංක 1840/51 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදයේ විධිවිධාන අනුව එහි පස්වන පරිශිෂ්ටයෙහි සඳහන් ආකාරයට විභාගය පිළිබඳ විස්තරය පහත දැක්වේ.

විභාග පිළිබඳ විස්තර -

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| කළමනාකරණය | පැය 03 | 100 | 100 |

**03. විභාගය සඳහාවන විෂයය නිර්දේශය :**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* | |
|---|---|---|
| කළමනාකරණය | 01 | කළමනාකරණ මූලධර්ම |
| | 02 | කළමනාකරණ ශ්‍රිතයන් |
| | 03 | කළමනාකරණ පරිසරය |
| | 04 | සහභාගීත්ව කළමනාකරණ |
| | 05 | මහජන සම්බන්ධතා |
| | 06 | යහ පාලනය |
| | 07 | ආචාර ධර්ම |

04. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වනු ලැබේ. අයදුම් කිරීමේ දී ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

